03

# සියබස්ලකරින් අනාවරණය වන සිංහල වෘත්ත සම්ප්‍රදායයෙහි විශේෂතා පිළිබඳ අධ්‍යයනයක්


**සම්පත්, එච්. ඩබ්. බී. අයි.**

බිහේෂ් ඉන්දික සම්පත් සිංහල විශේෂවේදී, දර්ශනපති, ආචාර්ය යන උපාධි හිමි කරගෙන ඇති අතර ඔහු මේ වන විට කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේ කථිකාචාර්යවරයකු වශයෙන් සේවය කරයි.



**සාරාංශය**

වෘත්ත වූකලි කාව්‍යයේ ආකෘතිය හා සම්බන්ධ වූ අංගයකි. එය සකස් වනුයේ මාත්‍රා, ගණ, විරාම, එළිසම ආදියෙනි. සිංහල වෘත්ත සම්ප්‍රදායය ගී, සිව්පද, සිලෝ, නිදහස් ආදි වශයෙන් විවිධ වේ. දැනට විද්‍යමාන වන පැරණිතම සිංහල වෘත්ත සංග්‍රහය වනුයේ දඹදෙණි යුගයේ භද්‍ර හිමියන් විසින් රචනා කරන ලද එළුසඳස්ලකුණයි. එහෙත් ඊට පූර්වයේ පටන් පැවත එන සිංහල වෘත්ත සම්ප්‍රදායයක් තිබූ බව ක්‍රිස්තු පූර්ව තුන් වන සියවසේ පමණ සිට රචනා වී ඇති පද්‍යමය සෙල්ලිපිවලින් ද සීගිරි ගී, මුවදෙව්දාවත, සසදාවත වැනි නිර්මාණවලින් ද සිදත් සඟරාවේ හා එළුසඳස්ලකුණේ එන දැනට නෂ්ටප්‍රාය චිරන්තන කාව්‍ය කෘතිවලින් උද්ධෘත කොට ගැනුණු පද්‍යයන්ගෙන් ද පැහැදිලි වේ. සිංහල වෘත්ත සම්ප්‍රදායයෙහි විශේෂතා පිළිබඳ අධ්‍යයනයේ දී සියබස්ලකරින් ද කිසියම් ආලෝකයක් ලබා ගත හැකි ය. ඒ වන විට කලාගුරුසුළුපා(අභයගිරි) වැසි වූ කල්‍යාණමිත්‍ර නම් හිමි නමකගේ ඡන්දස් ග්‍රන්ථයක් පැවති බව පවසන සියබස්ලකරකරුවා ඒ සමඟ ම පියුම්ගී, දෙපද, සිව්පද, සිතිලිගී, සැහැලි, ඇහැලි, අඹහැලි, සුන්හිස්, දෙව්පාණී (සියබස්ලකර 1.15-18) යනාදි වෘත්ත ලක්ෂණ නාමාවලියක් දක්වයි. එම හැඳින්වීම මත පදනම් ව සිංහල වෘත්ත සම්ප්‍රදායයේ විශේෂතා සියබස්ලකරින් අනාවරණය වේ ද යන ගැටලුව මුල් කොට ගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරේ. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සියබස්ලකර, එළුසඳස්ලකුණ, ඒවාට මූලාශ්‍රය භූමි වූ සංස්කෘත ඡන්දස් ග්‍රන්ථ ආදියත් ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ඒවා සම්බන්ධ ව පශ්චාත්කාලීනයන් ඉදිරිපත් කළ අර්ථ නිරූපණත් ඉවහල් කොට ගැනේ. දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයේ අනුවර්තනයක් වශයෙන් දස වන සියවසේ දී

අබාසලමෙවන් රද රචනා කළ සියබස්ලකර අලංකාර ග්‍රන්ථයක් විනා සිංහල විරිත් පිළිබඳ පරිපූර්ණ අවබෝධයක් ගෙන දෙන කෘතියක් නොවන බැවින් එහි එන වෘත්ත ලක්ෂණ පුළුල් ව විමසා බැලීමට විද්වතුන් පෙළඹී නැත. එහෙත් එය පූර්වෝක්ත ඡන්දස් ග්‍රන්ථ හා තුලනාත්මක ව අධ්‍යයනය කිරීම තුළින් චිරන්තන සිංහල ඡන්දස් සම්ප්‍රදායයේ විශේෂතා අනාවරණය කොට ගැනීම මෙම පර්යේෂණයේ අරමුණයි.

ප්‍රමුඛපද - පියුම්ගී, සිතිලිගී, දෙපා, සැහැලි, අඹහැලි

## ප්‍රවේශය

අනුරාධපුර යුගයේ ලක් රජය විචාළ අබා සලමෙවන් රද දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය අනුව යමින් සියබස්ලකර රචනා කොට ඇත්තේ සිංහල භාෂාවේ භාවිත වන අලංකාර පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ය. අලංකාර සමගම සාකච්ඡා කෙරෙන අනෙක් ශාස්ත්‍රය වූ ඡන්දස සම්බන්ධයෙන් වැඩිදුර විග්‍රහ කිරීමේ අපේක්ෂාවක් සියබස්ලකර කරුවා තුළ පැවති බවක් නොපෙනෙතත් කලාගුරු සුළුපායේ වාසය කරමින් සිටි කල්‍යාණමිත්‍ර හිමියන්ගේ ඡන්දස් ග්‍රන්ථය පිළිබඳ සඳහන් කරන අවස්ථාවේ දී ඡන්දස් නාමාවලියක් ඉදිරිපත් කොට තිබේ. කල්‍යාණමිත්‍ර හිමියන් ගේ කෘතිය මේ වන විට නෂ්ටප්‍රාය වී ඇතත් එය ඉපැරණි සිංහල ඡන්දස් ග්‍රන්ථයක් වශයෙන් සලකිය හැකි ය. සියබස්ලකරේ එම කෘතිය පිළිබඳ පැවසෙන තොරතුරු ආශ්‍රයෙන්, දැනට හමු වන පැරණිතම සිංහල ඡන්දස් සංග්‍රහය වන එළුසඳසට පූර්වයේ පැවති සිංහලයට අනන්‍ය වූ වෘත්ත සම්ප්‍රදායය අනාවරණය කර ගැනීම මෙම මෙහි අරමුණයි.

## වෘත්ත

කාව්‍යයේ ආකෘතියේ ප්‍රමුඛතම අංගයක් වන විරිත සකස් වනුයේ මාත්‍රා, ගණ, විරාම, එළිසම ආදි අංග සංයෝග වීමෙනි. වෘත්ත යනු සංස්කෘත වචනයකි. ඊට පර්යාය වූ සිංහල වචනය 'විරිත්' යන්න යි. 'වෘත්ත' යන සංස්කෘත පදයේ වටවූ, ආවරණය කළ, කවය, වටය, හැසිරීම ආදි අර්ථ රාශියක් ඇත. විරිත යනු ද ඒ අතරින් එක් අර්ථයකි. (විලියම්ස්: 2012: 761) කුමාරතුංග මුනිදාස ගේ විරිත් වැකියෙහි විරිත හඳුන්වා ඇත්තේ මෙසේ ය,

''අඩුවක් වැඩියක් - එක ද තැනෙකැ නොවන ලෙස මත් කැටි කොට මිහිරට - ගයන අයුරු විරිත් නම්'' (කුමාරතුංග: 2000: 134)

විරිත හෙවත් වෘත්තය පිළිබඳ ඒ. වී. සුරවීර ගේ සාහිත්‍ය විචාර ප්‍රදීපිකාවේ සඳහන් කොට ඇත්තේ ''ලඝු-ගුරු පිහිටුවීම, මාත්‍රා ගණන ආදිය අනුව වාක්‍යයක් හෝ පද්‍යයක් හෝ රචනා කිරීමේ දී මෙන් ම ගායනා කිරීමේ දී ද ලැබෙන තාලය, තාලානුකූල ව කියවිය හැකි හෝ ගැයිය හැකි වන සේ ගද්‍ය හෝ පද්‍ය හෝ වාක්‍යයක ගුරු-ලඝු පිහිටුවීම වෘත්ත හෙවත් විරිත් ගැන්වීම යි. පැරණි සාහිත්‍ය කරුවෝ තාලයකට කියැවිය හැකි වැකි ගෙන අසවල් විරිතට මෙතෙක් මාත්‍රා ය, මෙතෙක් ලඝු-ගුරු යයි නියම කළහ. ගුරු-ලඝුන් ගේ නියම වෘත්තය යි. (ගුරුලඝුනියමෝහවේවෘත්ති) කීයේ එබැවිනි.'' යනුවෙනි. (සුරවීර: 2005: 198)

ඡන්දස හා වෘත්තය යන සංකල්ප දෙක අතර ද වෙනසක් දක්නට ලැබේ. ඡන්දසක් යනු එක් පාදයක නිශ්චිත අක්ෂර (ලඝු-ගුරු වශයෙන්) සංඛ්‍යාවක් අඩංගු, එවැනි පාද සතරකින් සමන්විත වන පැදි මිනුම් වෙසෙසක් බවත් ලඝු-ගුරු භේදයක් නොසලකතොත් ඒවා වෘත්ත වශයෙන් භාවිත කළ හැකි බවත් පැවසිය හැකි වේ. (මාරසිංහ: 2005: XV)

**කල්‍යාණමිත්‍ර හිමියන් ගේ ඡන්දස් කෘතිය**

කල්‍යාණමිත්‍ර හිමි පිළිබඳ සියබස්ලකර කතුවරයා සඳහන් කොට ඇත්තේ මහත් ගෞරවයෙනි. ''කලාගුරුසුළුපා වැසි වූ කුළුණු නුවණ යුත් - කලණමිතෙවියතුන් ගත්හි පියුම් ලකුණු ඈ''(සෝරත හිමි: 2004: 15) යනුවෙනි. කල්‍යාණමිත්‍ර හිමියන්ගේ ඡන්දස් ග්‍රන්ථය සියබස්ලකරකරුවාගේ ගැඹුරු අධ්‍යයනයට හසු වන්නට ඇති බවත් එය එම යුගයේ සිංහල ඡන්දස් පිළිබඳ ප්‍රාමාණික මූලාශ්‍රය වශයෙන් පවතින්නට ඇති බවත් ඒ අනුව සිතිය හැකි වේ. සියබස්ලකරකරු 16-18 දක්වා ගීවලින් පවසා ඇත්තේ කලණමිත් වියතුන්ගේ කෘතියේ ඡන්දස් තොරතුරුවලින් කිහිපයක් බව පැහැදිලි ය.සිංහල ඡන්දස් ග්‍රන්ථයක් වශයෙන් තත් කෘතිය පවතින්නට ඇතත් අලංකාර ග්‍රන්ථයක ඌනතාව හෙයින් සියබස්ලකරකරු තම කෘතිය රචනා කළා විය හැකි ය.

**සියබස්ලකරේ දැක්වෙන මූලාශ්‍රය**

කාව්‍යාදර්ශයේ ඡන්දස සම්බන්ධයෙන් දැක්වෙනුයේ ඉතා සරල විග්‍රහයකි. "ඡන්දස ගැඹුරු කාව්‍ය සාගරයට පිවිසෙන්නට කැමති අයට නෞකාවකි." (ධර්මාරාම හිමි: 2009: 12) යන්න පමණකි එහි දැක්වෙනුයේ. එහෙත් සියබස්ලකර මුල් කෘතියට වෙනස් ව යමින් කලණමිත් හිමිගේ ග්‍රන්ථයට අනුව ඡන්දස පිළිබඳ තව දුරටත් අදහස් දක්වයි. සියබස්ලකරේ දැක්වෙන එකී වෘත්ත නාමාවලිය මෙසේ ය,

''පියුම් ගී දෙසතර'ට - දොළොස් සොළෙස් පද නම්
සැහැලි ඇහැලිදු නම් ඇත් - පිළි උපහැලි බැහැලි නම්
අඹහැලි නම් දැයක් - පිළි පිහියොඹු නම් ඇත්
සිතිලි ගී නම් යමෙකැත් - උනු සඳ, වසම් සඳ නම
යළි ගල සඳ නමැත් - සුන්හිස් යන්නෙකුදු ඇත්
දෙව්පාණි නමුදු ඇත් - පද බැඳුමෙහි නියර මේ'' (ඤාණසීහ හිමි: 1933: 16-18)

මෙම ගී තුනට අනුව විරිත් නාම 18ක් පිළිබඳ ව පැවසේ. ඒවා පළමු ගීයෙහි දහයක් ද දෙවැන්නෙහි පහක් ද තෙවැන්නෙහි තුනක් ද වශයෙන් ප්‍රකාශිත ය. නාමික ව දැක්වෙන එම විරිත්වල ලක්ෂණ පිළිබඳ එළුසඳැස්ලකුණේ දැක්වෙන විග්‍රහයන් ආශ්‍රයෙන් යම් අවබෝධයක් ලද හැකි වේ.

**16 ගීය**

| | වෘත්ත නාමය | ලක්ෂණ |
|---|---|---|
| 1 | පියුම් ගී | පාද සතර 8, 11, 8, 14 යන අගයයන්ගෙන් යුක්ත යි. |
| 2 | දෙපද | සිව්පදයකින් අඩකි. |
| 3 | සිව්පද | පාද සතරකි. |
| 4 | අට පද | පාද අටකි. (සිව්පද දෙකකි.) |

| | | |
|---|---|---|
| 5 | දොළෙස් පද | පාද දොළොසකි. (සිව්පද තුනකි.) |
| 6 | සොළෙස් පද | පාද දහසයකි. (සිව්පද සතරකි.) |
| 7 | සැහැලි | ගී සහ සිව්පද මිශ්‍ර විරිතකි. (සිතිලි ගී දෙකක් හෙවත් කඩවක් විරිත අගට සිව්පදයක් යෙදූ කල උවදෑ නම් දසපද සැහැල්ල යි. ඊට තවත් සිව්පද හා දෙපද එක් කොට සැහැල්ල දීර්ඝ කළ හැකි ය.) |
| 8 | ඇහැලි | දහ අට පද කඩවක් විරිත හෙවත් සිතිලි ගී 6ක් අගට සිව්පද තුනක් හා දෙපා කවක් යෙදම යි. (පාද 32) |
| 9 | උපහැලි | එළුසඳස නොදක්වන විරිතකි. (නවපද කඩවක් හෙවත් සිතිලි ගී 3ක් අගට සිව්පදයක් යෙදීම(?) පාද 13(?)) |
| 10 | බැහැලි | දොළොස් පද කඩවක් හෙවත් සිතිලි ගී 4ක් අගට සිව්පදයක් යෙදම යි. (පාද 16) |

17 ගීය

| | වෘත්ත නාමය | ලක්ෂණ |
|---|---|---|
| 11 | අඹහැලි | මාත්‍රා 19කින් යුත් කව් පදයක් හා මාත්‍රා පසින් යති යෙදෙන සිව්පදයක් බැගින් සතර වතාවක් යෙදීම යි. (පාද 20කි.) |
| 12 | පිහියොඹ | අවසන් අක්ෂරය ලඝු වන එළිසම දෙපෙළකින් යුතු වන විරිත යි. |

| | | |
|---|---|---|
| 13 | සිතිලි ගී | ගී අඩක් එක් පෙළකින් දක්වා ඒ අගට සිව් පදයකින් අඩක් යෙදම යි. (පාද 3කි.) |
| 14 | උනු සඳ | පළමු පාදය දෙවන පාදයට වඩා දර්ස වන මුනිනදන පෙරවිලුඹු විරිත දෙවරක් යොදා ගැනම යි. (පාද 4කි.) |
| 15 | වසම් සඳ | උනුසඳ විරිත අගට සිව්පදයක් යෙදීම යි. (පාද 8කි.) |

18 ගීය

| | වෘත්ත නාමය | ලක්ෂණ |
|---|---|---|
| 16 | ගල සඳ | මාත්‍රා 9, 7, 7 යන තැන්හි විරාමය තැබෙන සේ මාත්‍රා 22කට පර ව ගුරක් යෙදෙන්නා වූ පාද දෙකකින් අනතුරු ව සිව්පදයක් යෙදෙන විරිත යි. එම සිව්පදයේ අවසන් පාදය අන් පාදවලට වඩා මාත්‍රා හයකින් අඩු විය යුතු ය. (පාද 6කි.) |
| 17 | සුන්හිස් | මාත්‍රා 19කින් පරව යති යෙදෙන එළිසම පාදද්වයකින් පර ව සිව්පදයක් ද යෙදීම යි. (පාද 6කි.) |
| 18 | දෙව්පාණී | පළමු පාදයේ න, ස, ගුගු ලෙස ද, දෙවැන්නේ න, ස, ගු ලෙස ද, තෙවැන්නේ න, බ, ගු ලෙස ද, සිව්වැන්නේ ස, බ, ගු ලෙස ද ගණ හා ගුරු වර්ණ යෙදෙන්නා වූ අසමාන එළිසම ඇති විරිතකි. |

**සියබස්ලකරෙහි විරිත් එළුසඳස් ලකුණ හා සැසැඳීම**

කල්‍යාණ මිත්‍ර හිමියන් ගේ ඡන්දස් ග්‍රන්ථය ආශ්‍රයෙන් සියබස්ලකරකරුවා ඉදිරිපත් කොට ඇති ඉහත වෘත්ත ලක්ෂණ සිංහලයේ දනට විද්‍යමාන පැරණිතම ඡන්දස් ග්‍රන්ථය වන එළුසඳස හා සැසඳීමෙන් එම ග්‍රන්ථය ද සිංහලයේ පැවැති පිළිගත් ඡන්දස් සම්ප්‍රදායයකට අනුකූල ව ලියා තිබුණු බව පැහැදිලි කොට ගත හැකි වේ.

එළුසඳස්ලකුණේ ගී, සිව්පද, දෙපා, සැහැලි යන විරිත් විග්‍රහ කොට තිබේ. එහි 8-28 යන ගීවලින් ගී විරිත් ද, 29-64 යන ගීවලින් සිව්පද විරිත් ද, 81-84 යන ගීවලින් දෙපා ලකුණු ද, 85-104 යන ගීවලින් සැහැලි විරිත් ද, 106-113 යන ගීවලින් අඹහැලි, සුනිස්, වසම් සඳ, වසම් උනුසඳ, පිහියොඹ වැනි විරිත් ද සාකච්ඡා කෙරේ. (සෝරත හිමිː 2004) කල්‍යාණ මිත්‍ර හිමියන් ගේ කෘතිය අනුව යන සියබස්ලකර කතුවරයා ද ගී, දෙපා, සිව්පද, සැහැලි යන විරිත් කිහිපයක් විගහ කොට තිබේ. එහි 16 වන ගීයෙන් පියුම් ගී නම් ගී විරිත ද, දෙපා, සිව්පද, අට පද, දොළෙස් පද, සොළෙස් පද යන දෙපා, සිව්පද ආදි ගණයට වැටෙන විරිත් ද, සැහැලි, ඇහැලි, උපහැලි, බැහැලි යන ප්‍රධාන සැහැලි විරිත් ද ඉදිරිපත් කෙරෙන අතර 17 වන ගීයෙන් අඹහැලි, සිතිලි ගී, වසම් සඳ යන සැහැලි විරිත් ද, පිහියොඹු, උනු සඳ යන දෙපා විරිත් ද සඳහන් කෙරේ. 18 වන ගීය ගලසඳ, සුන්හිස් යන සැහැලි විරිත් ද, දෙව්පාණී නම් දෙපා විරිත ද දක්වයි. (ඤාණසීහ හිමිː 1933ː 16-18)

සංස්කෘත ඡන්දස් ශාස්ත්‍රයට අනුව වැදගත් කොට සලකනුයේ පද්‍යයේ ඒ ඒ පාදවලට අදාළ ලඝු-ගුරු නියමය හා යතිය යෙදෙන පිළිවෙළ යි. එහෙත් පාද ගණන පිළිබඳව ද සැලකිල්ලක් දැක්වීම සිංහල ඡන්දසෙහි ඇති අනන්‍යතා ලක්ෂණයක් වන බව පෙනේ. තව ද ලඝු-ගුරු සම්බන්ධ ව සිංහල ඡන්දස්කරුවන් තරමක් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කොට ඇති බවක් ද විද්‍යමාන වේ. සියබස්ලකරේ දැක්වෙන විරිත් සමූහය ඒවායේ පාද ගණන් සැලකීමෙන් පහත පරිදි බෙදා දැක්විය හැකි වේ.

- පාද 2 - දෙපා, පිහියොඹු
- පාද 4 - පියුම් ගී, සිව්පද, උනු සඳ, දෙව්පාණී
- පාද 6 - සිතිලි ගී, ගලසඳ, සුන්හිස්
- පාද 8 - අට පද, වසම් සඳ
- පාද 10 - සැහැලි (?)
- පාද 12 - දොළොස් පද
- පාද 13 - උපහැලි (?)
- පාද 16 - සොළොස් පද, බැහැලි
- පාද 20 - අඹහැලි
- පාද 32 - ඇහැලි

### සමාලෝචනය

සියබස්ලකර විරිත් පිළිබඳ නාමාවලියක් පමණක් දක්වන බැවින් ඒවා ගැන අදහසක් ලබා ගැනීම සඳහා එළුසඳස වැනි මූලාශ්‍රය වෙත යාමට සිදු වෙතත් සිංහල ඡන්දස් සම්ප්‍රදායයේ විවිධත්වය එහි දැක්වෙන වෘත්ත නාමාවලියෙන් පැහැදිලි කොට ගත හැකි වේ. ගී විරිත්, දෙපද, සිව්පද ආදි විරිත්, සැහැලි විරිත් යන ප්‍රභේදයන්ට අයත් විරිත් එහි ඉදිරිපත් කොට ඇත.

උපහැලි විරිත හැර සියබස්ලකර දක්වන සෙසු විරිත් දහහත ම එළුසඳස ඒ ආකාරයෙන් ම නම් කොට ඇත.උපහැලි විරිත යනු එළුසඳස් ලකුණෙ එන ලියහැලි විරිත විය හැකි බව ඤාණසීහ හිමියෝ පවසති. (ඤාණසීහ හිමි: 1933: 16)එළුසඳස ලියහැලි නමින් දක්වා ඇත්තේ සිතිලි ගී තුනක් හෙවත් නවපද කඩවක් විරිත අගට සිව්පදයක් යෙදීම යි. (සෝරත හිමි: 2004: 79)

සිංහල ඡන්දස වර්ණ ඡන්දස හා දැක්වූ සම්බන්ධය දෙව්පාණී වැනි විරිත්වලින් පැහැදිලි වේ. සියබස්ලකර දක්වන විරිත් අතුරින් හරි අඩක් ම (50%ක් ම) ඇත්තේ සැහැලි විරිත් ය. ඒවායෙන් බහුතරයක් සංස්කෘත වෘත්ත නාමවලින් වෙනස් වීම ද විශේෂත්වයකි. සියබස්ලකරේ සැහැලි, ඇහැලි, උපහැලි, බැහැලි, අඹහැලි, සිතිලි ගී, වසම් සද, ගලසඳ, සුන්හිස් යන සැහැලි විරිත් දක්වා තිබේ. සියබස්ලකර ද ඇතුළු ව දැනට විද්‍යමාන බොහෝ චිරන්තන පද්‍ය සාහිත්‍ය කෘති ගී විරිතට අනුව ලියැවී ඇතත් එහි සඳහන් කෙරෙනුයේ එක් ගී විරිතක් පමණි.

සියබස්ලකර ගී හා දෙපා, සිව්පද ආදි විරිත් පළමු කොට දක්වා ඉනික්බිති ව සැහැලි විරිත් දක්වා තිබීම ද ක්‍රමානුකූල විග්‍රහයකි. ගී, දෙපා හා සිව්පද එක් ව සැහැලි විරිත් බිහි වන බැවිනි. එහෙත් සිතිලි ගීයේ විස්තාරණයෙන් සැකසෙන සැහැලි, ඇහැලි, උපහැලි, බැහැලි වැනි විරිත් පළමුව දක්වා සිතිලි ගීය පසුව දැක්වීම දුර්වලතාවකි. මේ ආකාරයට ක්‍රමානුකූල ව ගොඩනැඟෙමින් පැවති සිංහල ඡන්දස් සම්ප්‍රදායයේ ආරම්භක අවධියත්, ඊට ම අනන්‍ය වූ සුවිශේෂතාත් සනිටුහන් කරන කෘතියක් වශයෙන් කල්‍යාණමිත්‍ර හිමියන් ගේ ඡන්දස් ග්‍රන්ථය පැවැති බව සියබස්ලකරේ ඒ පිළිබඳ ව පැවසෙන සීමිත තොරතුරු ආශ්‍රයෙන් පැහැදිලි කොට ගත හැකි වේ.

මූලාශ්‍රය

ඒකනායක, පුංචිබණ්ඩා, චිරන්තන සිංහල සාහිත්‍ය විචාර චින්තනයේ විකාසනය, කොළඹ, 1999
කුමාරතුංග, මුනිදාස, 2000, විරිත් වැකිය, කොළඹ
ඤාණසීහ හිමි,හේන්පිටගෙදර, 1933, සියබස්ලකර, කොළඹ,
ටිඩමන් මැන්දිස්,ඇම්, කව් ලකුණු මිණිමල්, 1953,මොරටුව
දයානන්ද, ඇන්දානේ, 1956, ලකුණුසර විවරණය, අම්බලන්ගොඩ
දීපංකර හිමි,ශ්‍රී, වුත්තෝදය, 1925, අලුත්ගම
ධර්මාරාම හිමි, රත්මලානේ, 2009, කාව්‍යාදර්ශය, කොළඹ
ධර්මාරාම හිමි, රත්මලානේ, 1902, සිදත් සඟරාව, කොළඹ
මාරසිංහ, වෝල්ටර්, 2005, නාට්‍ය ශාස්ත්‍රය ද්විතීය භාගය, කොළඹ
විලියම්ස්, මොලියර්, 2012, සංස්කෘත ඉංග්‍රීසි ශබ්දකෝෂය, නිව් දිල්ලි
සීලස්කන්ධ හිමි, ශ්‍රී, 1915, වෘත්ත රත්නාකරය, අලුත්ගම
සූරවීර, ඒ. වී, 2005, සාහිත්‍ය විචාර ප්‍රදීපිකා, කොළඹ
සෝරත හිමි, වැලිවිටියේ, 1935,එලු සඳස් ලකුණ, කොළඹ
සෝරත හිමි, වැලිවිටියේ, 1946, වෘත්ත රත්නාකරය, කොළඹ
Paranavitana, S, 1956, Sigiri Graffity, London.